# ශ්‍රී ලංකා ජනරජයේ ගැසට් පත්‍රය

## අති විශෙෂ

අංක 245/8A — 1976 දෙසැම්බර් 30 වැනි බ්‍රහස්පතින්ද — 1976.12.30

(ආණ්ඩුවේ බලය පිට ප්‍රසිද්ධ කරන ලදී.)


# IV වැනි කොටස—පළාත් පාලනය

## පළාත් පාලන නිවේදන

එල්.ඩී.—බී. 77/42

### කොළඹ මහා නගර සභාවේ ජලකර්මාන්ත ආඥාපනත

(208 වන අධිකාරය වූ) කොළඹ මහා නගර සභාවේ ජලකර්මාන්ත ආඥාපනතේ 40 වන වගන්තිය යටතේ කොළඹ මහා නගර සභාව විසින් සාදනු ලැබ, එකී ආඥාපනතේ 41 වන වගන්තිය යටතේ පළාත් පාලන අමාත්‍යවරයා විසින් ස්ථිර කරන ලද නියෝගය.

ඩී. ටී. එච්. අමරසේකර,
පළාත් පාලන අමාත්‍යාංශයේ ලේකම්.

1976 දෙසැම්බර් මස 24 වැනි දින,
කොළඹ දී ය.

### නියෝගය

(208 වන අධිකාරය වූ) කොළඹ මහා නගර සභාවේ ජලකර්මාන්ත ආඥාපනතේ දක්වා ඇති උපලේඛනයෙහි සඳහන්, කලින් කල සංශෝධිත නියෝගය පහත දක්වෙන පරිදි මෙයින් තවදුරටත් සංශෝධනය කරනු ලැබේ :—

(1) එහි 32 වන නියෝගයෙහි :

(අ) (ඇ) ඡේදයෙහි ''තබා ගැනීම'' යන යෙදුම වෙනුවට ''තබා ගැනීම;'' යන යෙදුම ආදේශ කිරීමෙන් ; සහ

(ආ) (ඇ) ඡේදයට ඉක්බිතිව ම පහත සඳහන් අලුත් ඡේදය ඇතුළත් කිරීමෙන්:—

'' (ඉ) ජලය පාවිච්චියට ගනු ලබන යම් ව්‍යාපාරයක් සඳහා.'' ;

(2) එහි 33 වන නියෝගයෙහි, (අ) ඡේදයෙහි, ''පිහිනුම් නාන ඔරු'' යන යෙදුම වෙනුවට ''යම් ව්‍යාපාරයක් සඳහා පාවිච්චි කරනු නොලබන පිහිනුම් නාන ඔරු'' යන යෙදුම ආදේශ කිරීමෙන් ;

(3) එහි 34 වන නියෝගයෙහි :

(අ) (i) වන ඡේදයේ —

(i) (අ) වන අනුඡේදය වෙනුවට පහත සඳහන් අලුත් අනුඡේදය ආදේශ කිරීමෙන් :—

''(අ) (i) යම් වෙළඳාමක් හෝ නිශ්පාදන කර්මාන්තයක් පවත්වා ගෙන යාමේ හෝ කර ගෙන යාමේ කාර්යය සඳහා;

(ii) භෝජනාගාරයක්, ආපණ ශාලාවක්, නවාතැන්පලක් හෝ පෞද්ගලික නේවාසිකාගාරයක් පිළිබඳ කාර්යය සඳහා ;

(iii) පොදු නාන ස්ථානයක් වශයෙන් ;

(iv) විකිණීම සඳහා හෝ කුලියට දීම සඳහා අශ්වයින්, ගවයින් හෝ වාහන තබා ගැනීම සඳහා ;

(v) ජලය පාවිච්චි කරනු ලබන වෙන යම් ව්‍යාපාරයක් පිළිබඳ කාර්යය සඳහා

සම්පූර්ණ නිවසක හෝ ඉන් කොටසක පදිංචිව සිටින අවස්ථාවක, ඒ නිවසට එක් ඝන මීටරයකට රු. 1.10 බැගින් නැතහොත් ගැලුම් 1,000කට රු. 5 බැගින්;''

(ii) (ආ) වන අනුඡේදය වෙනුවට පහත සඳහන් අලුත් අනුඡේදය ආදේශ කිරීමෙන් :—

''(ආ) (i) යම් ව්‍යාපාරයක් සම්බන්ධයෙන් පාවිච්චි කරනු නොලබන පිහිනුම් නාන ඔරු සඳහා ජලය පාවිච්චි කරන ස්ථානවලට, එක් ඝන මීටරයකට ශත 55 බැගින් නැතහොත් ගැලුම් 1,000කට රු. 2.50 බැගින් ;

(ii) යම් වෙළඳාමක් සම්බන්ධයෙන් පාවිච්චි කරනු නොලබන වතුර මල් හෝ ද්‍රාව මෝටර් සඳහා ජලය පාවිච්චි කරන ස්ථානවලට, එක් ඝන මීටරයකට ශත 55 බැගින් නැතහොත් ගැලුම් 1,000කට රු. 2.50 බැගින් ;

(iii) ගොඩනැගිලි සහ පාරවල් තැනීමේ සහ පාරවල් අළුත්වැඩියා කිරීමේ කාර්යයන් සඳහා ජලය පාවිච්චි කරන ස්ථානවලට, එක් ඝන මීටරයකට රු. 1.10 බැගින් නැතහොත් ගැලුම් 1,000කට රු. 5 බැගින්;''

1 A— G 24465—1,555 (76/12)

(iii) (ඇ) වන අනුඡේදය වෙනුවට පහත සඳහන් අලුත් අනුඡේදය ආදේශ කිරීමෙන් : —

" (ඇ) පදිංචිය සඳහා සම්පූර්ණ වශයෙන්ම යොදා ගෙන ඇති සහ වතුවලට හෝ මිදුල්වලට දැමීම සඳහා ජලය පාවිච්චි කරන ස්ථානවලට, පහත සඳහන් පරිදි නොමිලේ සපයනු ලබන ප්‍රමාණය ඉක්මවා පාවිච්චි කරනු ලබන යම් ප්‍රමාණයක් සඳහා එක් ඝන මීටරයකට රු. 1.10 බැගින් නැතහොත් ගැලුම් 1,000 කට රු. 5 බැගින් :

| | එක් කාර්තුවකට නොමිලේ සපයනු ලබන ජල ප්‍රමාණය | |
|---|---|---|
| | ඝන මීටර් | ගැලුම් |
| (i) රු. 2,000කට අඩු වාර්ෂික වටිනාකමක් ඇති ස්ථානයක් ... ... | 150 ... | 33,000 |
| (ii) රු. 2,000ක, එහෙත් රු. 3,000කට අඩු, වාර් ික වටිනාකමක් ඇති ස්ථානයක් ... | 180 ... | 39,600 |
| (i.i) රු. 3,000ක, එහෙත් රු. 4,000කට අඩු, වාර්ෂික වටිනාකමක් ඇති ස්ථානයක් ... | 200 ... | 44,000 |
| (iv) රු. 4,000ක, එහෙත් රු. 6,000කට අඩු, වාර් ක වටිනාකමක් ඇති ස්ථානයක් ... | 220 ... | 48,400 |
| (v) රු. 6,000ක, එහෙත් රු. 8,000කට අඩු, වාර් ක වටිනාකමක් ඇති ස්ථානයක් ... | 270 ... | 59,400 |
| (v ) රු. 8,000ක, එහෙත් රු. 10,000කට අඩු, වාර් ක වටිනාකමක් ඇති ස්ථානයක් ... | 340 ... | 74,800 |
| (vi.) රු. 10,000ක සහ ඊට වැඩි වාර් ක වටිනාකමක් ඇති ස්ථානයක් ... | 450 ... | 90,000"; |

(iv) (ඈ) වන අනුඡේදයේ "ගැලුම් 1,000කට ශත 50 බැගින්" යන වචන සහ ඉලක්කම් වෙනුවට "එක් ඝන මීටරයකට ශත 55 බැගින් නැතහොත් ගැලුම් 1,000කට රු. 2.50 බැගින්" යන වචන සහ ඉලක්කම් ආදේශ කිරීමෙන්;

(ආ) එහි (2) වන සහ (3) වන ඡේද වෙනුවට පහත සඳහන් අලුත් ඡේද ආදේශ කිරීමෙන් : —

" (2) නැව් ගමන් සඳහා මීටරයක් මගින් සපයනු ලබන ජලය සඳහා ගාස්තුව මෙසේය :

(අ) පාරු හැර කුඩා වල යාත්‍රාවලට ජලය සපයනු ලබන අවස්ථාවල, එක් ඝන මීටරයක් සඳහා රු. 1.65 බැගින් නැතහොත් ගැලුම් 1,000ක් සඳහා රු. 7.50 බැගින් ;

(ආ) පාරුවලට ජලය සපයනු ලබන අවස්ථාවල, එක් ඝන මීටරයක් සඳහා රු. 1.32 බැගින් නැතහොත් ගැලුම් 1,000ක් සඳහා රු. 6.00 බැගින් ;

(3) (1) වන සහ (2) වන ඡේදවල කාර්යයන් සඳහා, ඝන මීටර් 5ක් අතුරින් ශේෂව ඇති යම් භාගයක් හෝ ඝන මීටර් 5කට අඩු යම් ප්‍රමාණයක් හෝ ඝන මීටර් 5ක් ලෙස ගණන් ගත යුතු අතර පාරිභෝග කිරීම ගැලුම් වශයෙන් මනිනු ලබන්නේ නම්, ගැලුම් 1,000කින් ශේෂව ඇති යම් භාගයක් හෝ ගැලුම් 1,000කට අඩු යම් ප්‍රමාණයක් හෝ ගැලුම් 1,000ක් ලෙස ගණන් ගත යුතු ය.";

(4) එහි 35 වන නියෝගයේ :

(අ) (i) වන ඡේදයෙහි "එක් කාර්තුවක් සඳහා" යන වචනවල සිට ඇති සියලුම වචන හා ඉලක්කම් වෙනුවෙන් පහත සඳහන් කොටස ආදේශ කිරීමෙන්:—

| | "එක් කාර්තුවක් සඳහා | අර්ධ වර්ෂයක් සඳහා |
|---|---|---|
| | රු. ශ. | රු. ශ. |
| පළමුවන අක්කර භාගය හෝ ඉන් කොටසක් සඳහා ... ... ... | 22 50 ... | 90 0 |
| පළමුවන අක්කර භාගයට අමතරව, සෑම අක්කර කාලක් හෝ ඉන් කොටසක් සඳහා ... | 7 50 ... | 30 0"; |

( ා) එහි (2) වන ඡේදය වෙනුවට, පහත සඳහන් අලුත් ඡේදය ආදේශ කිරීමෙන්: —

" (2) විකිණීම හෝ කුලියට දීම සඳහා අශ්වයින්, ගවයින් හෝ රථවාහන තබා ගෙන තිබෙන ස්ථානවලට සපයනු ලබන ජලය සඳහා—

| | එක් මසකට |
|---|---|
| | රු. ශ. |
| එක් එක් වාහනයක් හෝ මෝටරයක් සඳහා ... ... ... | 5 0 |
| එක් එක් ජින් රික්ෂෝවක් සඳහා ... ... ... ... ... | 1 25 |
| එක් එක් අශ්වයකු හෝ කොටළුවකු සඳහා ... ... ... ... | 4 0 |
| එක් එක් බූරුවකු සඳහා ... ... ... ... ... | 1 75 |
| එක් එක් ගොනකු සඳහා ... ... ... ... ... | 1 75 |
| එක් එක් බක්කි කරත්තයක් සඳහා ... ... ... ... | 1 25"; |

(ඇ) එහි (4) වන ඡේදය පහත සඳහන් පරිදි සංශෝධනය කිරීමෙන්: —

(i) එහි (අ) වන අනුඡේදයේ, "එක් එක් හතරැස් අඩියක් සඳහා ශත දෙක බැගින්" යන වචන වෙනුවට, "හතරැස් සෙන්ටි මීටර් නුවක එක් එක් ඒකකය සඳහා ශතයක් බැගින් හෝ එක් එක් හතරැස් අඩියක් සඳහා ශත දහය බැගින්" යන වචන ආදේශ කිරීමෙන් ;

(ii) එහි (ආ) වන අනුඡේදයේ, "එක් එක් ඝන අඩියට ශතය බැගින්" යන වචන වෙනුවට, "ඝන සෙන්ටි මීටර පන්දහසක එක් එක් ඒකකය සඳහා ශතය බැගින් හෝ එක් එක් ඝන අඩිය සඳහා ශත පහ බැගින්" යන වචන ආදේශ කිරීමෙන් ; සහ

(iii) ( ා) වන අනුඡේදයේ අතුරු අනුඡේදයේ, "ගැලුම් එක් දහකට එක රුපියල බැගින්" යන වචන වෙනුවට "එක් ඝන මීටරයක් සඳහා රුපියලකුත් ශත දහය බැගින් හෝ ගැලුම් එක් දහසකට රුපියල් පහ බැගින්" යන වචන ආදේශ කිරීමෙන්.;

(ඈ) එහි (6) වන ඡේදයේ, කාර්තුවකට රු. 14 ක්.(යම් ටබ් එකක ධාරිතාව ගැලුම් 80 ක් නොඉක්මවිය යුතුය.) යන වචන සහ ඉලක්කම් වෙනුවට, "කාර්තුවකට රු. 70 ක් (යම් ටබ් එකක ධාරිතාව ලීටර් 500 ක් හෝ ගැලුම් 110 ක් හෝ නොඉක්මවිය යුතුය.) යන වචන සහ ඉලක්කම් ාදේශ කිරීමෙන්.";

(ඉ) එහි (7) වන ඡේදය වෙනුවට, පහත සඳහන් අලුත් ඡේදය ාදේශ කිරීමෙන්:—

" (7) ගෘහ්‍ය කාර්යයන් සඳහා සපයනු ලැබ, රථවාහන සේදීම සඳහා බාහිර කරාමයක් මගින් පාවිච්චි කරනු ලබන ජලය සඳහා:—

| | බාහිර කරාමය සම්බන්ධයෙන් හෝස් පයිප්පයක් හෝ ඒ හා සමාන උපකරණයක් පාවිච්චි කරනු ලබන්නේ නම් | | බාහිර කරාමය සම්බන්ධයෙන් හෝස් පයිප්පයක් හෝ ඒ හා සමාන උපකරණයක් පාවිච්චි කරනු නොලබන්නේ නම් | |
|---|---|---|---|---|
| | එක් මසකට | එක් වර්ෂයකට | එක් මසකට | එක් වර්ෂයකට |
| (අ) එක රථ වාහනයක් සඳහා ... ... | 5 00 | 60 00 ... | 3 75 | 45 00 |
| (ආ) එක රථ වාහනයකට වැඩි එක් එක් රථ වාහනය සඳහා | 3 75 | 45 00 ... | 2 50 | 30 00 "; |

(5) එහි 36 වන නියෝගයේ, " එක් කැනැත්තකුට ශත 50 " යන වචන සහ ඉලක්කම් වෙනුවට " එක් කැනැත්තකුට රු. 2.50 " යන වචන ආදේශ කිරීමෙන් ";

(6) එහි 42 වන නියෝගයේ, " ඔක්තෝබර් මස පළමුවන දින ආරම්භ වන ලෙස සලකනු ලැබිය යුතු ය " යන වචනවල සිට ඒ නියෝගයේ අවසානය දක්වා ඇති සියලුම වචන සහ ඉලක්කම් වෙනුවට පහත සඳහන් කොටස ආදේශ කිරීමෙන් :—

" ඔක්තෝබර් මස පළමුවන දින ආරම්භ වන ලෙස සලකනු ලැබිය යුතුය :—

| | | |
|---|---|---|
| අඟල් 10 මීටරයක් සඳහා කාර්තුවකට හෝ කාර්තුවකින් කොටසකට | ... ... | රු. 250 |
| අඟල් 8 මීටරයක් සඳහා කාර්තුවකට හෝ කාර්තුවකින් කොටසකට | ... ... | රු. 220 |
| අඟල් 6 මීටරයක් සඳහා කාර්තුවකට හෝ කාර්තුවකින් කොටසකට | ... ... | රු. 150 |
| අඟල් 4 මීටරයක් සඳහා කාර්තුවකට හෝ කාර්තුවකින් කොටසකට | ... ... | රු. 140 |
| අඟල් 3 මීටරයක් සඳහා කාර්තුවකට හෝ කාර්තුවකින් කොටසකට | ... ... | රු. 90 |
| අඟල් 2 මීටරයක් සඳහා කාර්තුවකට හෝ කාර්තුවකින් කොටසකට | ... ... | රු. 50 |
| අඟල් 1½ මීටරයක් සඳහා කාර්තුවකට හෝ කාර්තුවකින් කොටසකට | ... ... | රු. 36 |
| අඟල් 1 මීටරයක් සඳහා කාර්තුවකට හෝ කාර්තුවකින් කොටසකට | ... ... | රු. 20 |
| අඟල් ¾ මීටරයක් සඳහා කාර්තුවකට හෝ කාර්තුවකින් කොටසකට | ... ... | රු. 16 |
| අඟල් ½ මීටරයක් සඳහා කාර්තුවකට හෝ කාර්තුවකින් කොටසකට | ... ... | රු. 14 |
| අඟල් ¼ මීටරයක් සඳහා කාර්තුවකට හෝ කාර්තුවකින් කොටසකට | ... ... | රු. 6 |

මෙට්‍රික් ඒකකවලින් ප්‍රමාණය ප්‍රකාශ කරනු ලැබ ඇති මීටරයක් සම්බන්ධයෙන් වන විට, එක් එක් මිලිමීටර් 20 අඟල් 1කට සමාන වන පදනමක් මත ඉහත සඳහන් අනුප්‍රමාණ අනුව කුලිය ගණන් බැලිය යුතු ය. ඉහත සඳහන් පරිදි අඟල් බවට වෙනස් කරන ලද විට, මීටරයක ප්‍රමාණය ඉහත සඳහන් යම් මීටරයක ප්‍රමාණයට සමාන නොවන අවස්ථාවක, එසේ වෙනස් කරන ලද විට ඇති ප්‍රමාණය ලඟට ඇති, ඊට වඩා විශාල වූ ද ඉහත සඳහන් කර ඇත්තාවූ ද මීටරයේ ප්‍රමාණය සම්බන්ධයෙන් ගෙවිය යුතු අනුප්‍රමාණය අනුව කුලිය ගණන් බැලිය යුතු ය. " ;

(7) එහි 46 වන නියෝගයෙහි " රු. 20ක් වූ ගාස්තුවක් " යන වචන සහ ඉලක්කම් වෙනුවට " රු. 40ක් වූ ගාස්තුවක් " යන වචන සහ ඉලක්කම් ආදේශ කිරීමෙන් " ; සහ

(8) එහි " අ " ආකෘතිය වෙනුවට පහත සඳහන් අලුත් " අ ආකෘතිය " ආදේශ කිරීමෙන් :—

(9) " ඇ " ආකෘතියේ " ඝන අඩි " යන වචන අත් හැරීම.

(10) " ඉ " ආකෘතියේ " ගැලුම් 1,000 කට " යන වචන සහ ඉලක්කම් වෙනුවට "ඝන මීටරයකට" යන වචන සහ ඉලක්කම් ආදේශ කිරීම. ගැලුම් 1,000 කට ".

"අ" ආකෘතිය

(4 වන නියෝගය)

මීටර මගින් ගෘහය කාර්යයන් නොවන කාර්යයන් සඳහා ජලය සැපයීම පිණිස එක් පාර්ශවයකට (මින්මතු"අයිතිකරු"වශයෙන් සඳහන් කරනු ලබන) ..............................................................ත් අනික් පාර්ශවයට මහා නගර සභාවත් අතර එළඹෙන ගිවිසුම යි.

2. ඉහත සඳහන් ..............................................ස්ථානයට ගෘහය කාර්යයන් නොවන කාර්යයන් සඳහා, එනම් (අ), (ආ) සහ (ඇ) සඳහා ජලය සම්පාදනයකට අවසරදීම හේතුකොටගෙන අයිතිකරු මෙහි මින්මතු සඳහන් කරනු ලබන කොන්දේසිවලින් බැඳී සිටීමට මෙයින් එකඟ වෙයි:—

(අ) ...................... මීටරයක් මගින් ජලය සැපයිය යුතු ය;

(ආ) ...................... මීටරයේ කුලිය වශයෙන් කාර්තුවකට රුපියල් .......... ක් අයිතිකරු විසින් මහා නගර සභාවට කලින් ගෙවිය යුතුය. නැතහොත් එසේ ගෙවීමට සැලැස්විය යුතු ය;

(ඇ) මාසය තුළ සපයනු ලබන ජල ප්‍රමාණය සඳහා ඝන මීටරයකට*

ගැලුම් දහසකට*

රුපියල් ...................... බැගින් අයිතිකරු විසින් කොළඹ මහා නගර සභාවට ගෙවිය යුතුය. නැතහොත් එසේ ගෙවීමට සැලැස්විය යුතු ය. පළමුවන ගෙවීම.......................................... මාසයේ පළමුවන දින කළ යුතු ය.

3. නියමිත දිනයේ සිට දින පහළොවක් ඇතුළත මීටර කුලිය හෝ ජල ගාස්තු හෝ ගෙවනු නොලැබුවහොත්, ජල සේවය පාවිච්චි කිරීමේ අයිතිය අහිමි කරනු ලබන අතර මහා නගර සභාව විසින් ජල සම්පාදනය කපා හරිනු ලැබිය හැකි ය.

4. කොළඹ මහා නගර සභාවේ ජල කර්මාන්ත ආඥාපනතේ සහ ඒ යටතේ සාදන ලද නියෝගවල විධිවිධාන මෙම ගිවිසුමේ කොටසක් ලෙස සැලකිය යුතු අතර එකී ආඥාපනතේ යම් වගන්තියක් යටතේ මින්මතු සාදනු ලබන නියෝගවලින් ද මෙම ගිවිසුමට සම්බන්ධ පාර්ශවයන් බැඳෙන්නාහ.

5. ගිවිසුම අවසන් කිරීමට එක් පාර්ශවයක් තුළ ඇති අදහස ගැන අනික් පාර්ශවයට දින ..........................ක දැනුම්දීමක් කිරීමෙන් පසු මෙම ගිවිසුම දෙපාර්ශවයෙන් ඕනෑම පාර්ශවයක් විසින් අවසන් කරනු ලැබිය හැකිය. ගිවිසුම එසේ අවසන් කරනු ලැබුවහොත් අලුත් ගිවිසුමක් ඇති කර ගනු ලබන තුරු ස්ථානයේ අයිතිකරුට හෝ පදිංචිකරුට ජල සේවය පාවිච්චි කිරීම සඳහා හිමිකම් නොලැබෙන්නේය.

6. පදිංචිකරුවන්ගේ වෙනසක් සිදුවීමට ඉඩ ඇති කවර විටක වුව ද අයිතිකරු විසින් ඒ බව යථා පරිදි දැනුම් දිය යුතු අතර ඉහත සඳහන් කර ඇති කොන්දේසිවලින් බැඳී සිටීමට යම් පදිංචිකරුවකු ලියවිල්ලකින් එකඟවන තුරු ජල සේවය පාවිච්චි කිරීමට ඔහුට හිමිකම් නොලැබෙන්නේය.

19............................මස...................... වන දින කොළඹ දී අත්සන් කරන ලදී.

..................................
අයිතිකරු

..................................
මහා නගර සභාව වෙනුවෙන් ජලකර්මාන්ත ඉංජිනේරුවරයා.

අත්සන්වලට සාක්ෂි :

(1) ......................

(2) ......................

ඉහත දැක්වෙන ගිවිසුමේ නියමයන්ගෙන් බැඳී සිටීමට මම ද එකඟ වෙමි.

19......................මස.............. වන දින කොළඹ දී අත්සන් කරන ලදී.

..................................
පදිංචිකරු.

අත්සන්වලට සාක්ෂි

(1) ......................

(2) ......................

*අදාළ නොවන වචන කපා හරින්න.

ශ්‍රී ලංකා රජයේ මුද්‍රණ දෙපාර්තමේන්තුවේ මුද්‍රණය කරන ලදී